

# ක්ෂුද්‍ර මූල්‍ය සංකල්ප

තම ජීවිතය ඥානාන්විතව ජය ගැනීම ණය ලබා ගන්නාගේ පරම යුතුකම බව ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමයේ මූලික අභිප්‍රායක් බව අපි දනිමු. ණය ලබාගෙන ඒ ණය කලට වේලාවට ගෙවීමට නම්, එම ණය මුදල් ක්‍රමානුකූලව ආදායම් උපදවන කර්මාන්තයක, සේවයක හෝ වෙනයම් ව්‍යාපාරයක යෙදිය යුතුම වේ. එවිට ණය ගෙවීම පමා නොකොට, අඩුවෙන් නොගෙවා ,නොගෙවීම අමතක කොට දෙවන තුන්වන ණය මුදල් කරා ළගා විය හැකිය. එම මුදල්ද ක්‍රමානුකූලව ගෙවෙනු ඇත. එවිට ඔබ අනිවාර්යයෙන්ම ජය කණුව වෙත නොදැනිම ළගා වනු ඇත. ඒ ණය ලබා ගන්නාගේ යුතුකමයි.

ණය ලබා දෙන්නාගේ යුතුකම වනුයේ ඊට වඩා බැරෑරුම් කාර්යයකි.
ණය කලට වෙලාවට අවශ්‍යම අවස්ථාවේදි ලබා දිය යුතුය. වෙළෙඳ ක්ෂේත්‍රයේ හෝ බැංකු ක්ෂේත්‍රයේ ඇපයක් හෝ ඇප කාරයෙකු නැතිව ලබා දෙන මේ ණය මුදල් වල පොලී අනුපාතය ඉතා සාධාරණ විය යුතුය. ණය මුදල් ලබාදීම මගින් ණය ලබා ගන්නාගේ ජීවිතය හරි මගට ගන්නට, ව්‍යාපාරය ජය ගන්නට ගුරුහරුකම් ලබාදිය යුතුය. ප්‍රායෝගික ජීවිතයේ ධනවතුන් ලබන සියලු වරප්‍රසාද දුප්පතුන්ටද ලබා ගන්නට කටයුතු යෙදිය යුතුය. ණය ලබාගන්නාගේ දූ පුතුන්ගේ ඉගෙනිමේ කටයුතු නිසියාකාරව කර ගැනිමට ඉඩ සැලසිය යුතුය.

ව්‍යාපාරයට අවශ්‍ය නම් වාහනයක් ගන්නට උදව් කල යුතුය. ගෙදර පරිසරය සාමකාමීව ගෙවීමට මග පෑදිය යුතුය. රක්ෂණ ආවරණ තුලින් තම ජීවිතයේ බර සැහැල්ලු කර ගැනිමට ඇති අයිතිය දුප්පතාටද හිමිවිය යුතුය.

එය එසේ නම්, රක්ෂණ ක්ෂේත්‍රය, ලීසිං ක්ෂේත්‍රය, ඉගෙනිමේ කටයුතු සඳහා ණය මුදල් මෙන්ම තමාගේම නිවසක් තනා ගැනිමට ණය ලබාදිමද ක්ෂුද්‍ර ණය ව්‍යාපෘති වලට ඉක්මනින් එක් විය යුතුය. මෙම සියලු පහසුකම් දුප්පතාට මිලදී ගැනිමට හැකිවන සාධාරණ මුදලකට විය යුතුය.

මේ සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘති වල අගය වටහාගෙන රජය මෙම පහසුකම් ලබාදිමට ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරිකයන්ට අතදිය යුතුව ඇත. දිරි ගැන්විය යුතුව ඇත.

අපි සියලු දෙනා මේ සඳහා ඇපකැප වීමට ඉතා කැමැත්තෙමු.

අදහස
වික්ටර් රත්නායක.